කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක: 31

මගේ අංකය:ඩීඑම්එස්/බෝනස්/01
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

2006.12. 11 දින.

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙතය,**

**රාජ්‍ය සංස්ථාවල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට 2006 වර්ෂය සඳහා ප්‍රසාද මුදල් ගෙවීම.**

රාජ්‍ය සංස්ථාවල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට 2006 වර්ෂය සඳහා ප්‍රසාද මුදල් ගෙවීම, අමාත්‍ය මණ්ඩලය විසින්, 2006.12.06 වැනි දින පැවැත්වුන ස්වකීය රැස්වීමේ දී අනුමත කරනු ලැබ ඇත. ඒ අනුව, ප්‍රසාද මුදල් ගෙවීමෙහිලා පහත සඳහන් මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතුවේ.

(අ) ආයතනයක් විසින් ප්‍රසාද මුදල් ගෙවනු ලැබීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන්, ඉකුත් වර්ෂය (2005) සඳහා වූ වාර්ෂික ගිණුම්, 2002.05.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ්/පීඊ/21 හි 3 ඡේදය ප්‍රකාරව, 2006.02.28 වැනි දිනට හෝ ඊට මත්තෙන් හෝ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතුය.

(ආ) ප්‍රසාද මුදල් ගෙවීම, 2006 වර්ෂය සඳහා ඒ ඒ සංස්ථාව/සම්පූර්ණයෙන් රජය සතු සමාගම විසින් ලාභ උපයනු ලැබීම මත රඳා පැවතිය යුතුය. එම ලාභයෙහි පදනම විය යුත්තේ 2006 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබ ඇති ලාභාලාභ ගිණුමය.

(ඇ) ලාභ උපයාගෙන ඇති එවැනි රාජ්‍ය සංස්ථාවල/සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවකයින්ට රු.10,000/- ක් හෝ මාස දෙකක (02) දළ වැටුප හෝ යන දෙකින් කවරක් හෝ **අඩු මුදල ප්‍රසාද මුදලක්** වශයෙන් ගෙවනු ලැබිය හැකිය.

(ඈ) වාර්ෂික ප්‍රසාද මුදලට අමතර වශයෙන්, පැමිණීම හා සම්බන්ධ කොටගත් දිරිකාරකයක් වැනි දිරිකාරක ක්‍රමයන් අඛණ්ඩව තම සේවකයන්ට පිරිනමමින් සිටින ලාභ උපයන ආයතනයන් 2005 වර්ෂයේ දී එවැනි ගෙවීම් කළේ නම්, ඒ ඒ ආයතනයේ අවශ්‍යතාවයන් මත, තවදුරටත් එසේ කිරීමට ඒවාට අවසර දෙනු ලැබේ. එහෙත්, මෙම අවසරය දෙනු ලබන්නේ එම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික ප්‍රසාද මුදල ද රු. 7,500/- ක් හෝ මාස දෙකක (02) දළ වැටුප හෝ යන දෙකින් කවරක් හෝ අඩු මුදල විය යුතුය යන ව්‍යාතිරේකයට යටත්වය.

ප්‍රසාද මුදල් ගෙවීම පදනම් විය යුත්තේ ඉහත (ඇ) සහ (ඇ) හි සඳහන් ක්‍රම දෙකින් එකක් මත පමණි.

මෙහි සඳහන් දිරිකාරක යෝජනා ක්‍රමයන්ට, භාණ්ඩාගාරය විසින් අනුමත කරනු ලැබ ඇති නිෂ්පාදිතයෙහි, සේවයට පැමිණීමෙහි සහ/හෝ ආදායම් උත්පාදනයෙහි වැඩිවීම පිළිබඳ පිළිගත් නිර්නායකයන් හා සෘජුවම සම්බන්ධ සියළුම දිරිකාරක යෝජනා ක්‍රමයන් ඇතුළත් වේ.

(ඉ) පාඩු ලබන ආයතනයකට රු.1000/- ක ප්‍රසාද මුදලක් පමණක් ගෙවීමට අවසර දෙනු ලැබේ. එහෙත්, එම අවසරය දෙනු ලබන්නේ පවත්නා වර්ෂය (2006) සඳහා එම ගෙවීම් කිරීමට ප්‍රමාණවත් තරම් අරමුදල් අදාල ආයතනයන් සතුව ඇත්තේ නම් පමණි.

(ඊ). තම පුනරාවර්තන සහ/හෝ මූලධන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රදානයන් මත යැපෙන ආයතනයන්, ප්‍රසාද මුදල් ගෙවීමට හිමිකම් නොලබයි. අනුමත සෙස් අරමුදල් ද ප්‍රසාද මුදල් ගෙවීම සඳහා හිමිකම් නිශ්චය කිරීමේ කාර්යාර්ථයන් සඳහා සලකනු ලබන්නේ භාණ්ඩාගාර අරමුදල් වශයෙනි.

(උ) ප්‍රසාද මුදල් ගෙවීම සේවයට පැමිණීම හා බැඳී පවතී. එබැවින්, අදාල වර්ෂය තුලදී දින 10 ක් හෝ ඊට වැඩියෙන් වැටුප් රහිත නිවාඩු ලබා ඇති සේවකයින්ට කිසිම ප්‍රසාද මුදලක් නොගෙවිය යුතුය. දින 10 කට අඩුවෙන් වැටුප් රහිත නිවාඩු ලබා ඇති සේවකයින්ගේ ප්‍රසාද මුදලින් දිනකට 1/10 වශයෙන් අනුපාතික අඩුකිරීම් කළ යුතුය.

02. සංස්ථාවල/සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල පූර්ණකාලීන සභාපතිවරුන්ට සහ පූර්ණකාලීන ක්‍රියාකාරී/විධායක අධ්‍යක්ෂවරුන්ට ද ඉහත නියම කොට දක්වා ඇති කොන්දේසිවලට යටත්ව මෙම ප්‍රසාද මුදල ලැබීමට හිමිකම් ඇත. ස්ථිර පුරප්පාඩු පිරවීම සඳහා සේවයෙහි යොදවා ගනු ලැබ සිටින අනියම්/කොන්ත්‍රාත්තුගත සේවකයින්ටද අදාල සංස්ථාවේ/සම්පූර්ණයෙන් රජය සතු සමාගමේ අනිකුත් සේවකයින් කෙරෙහි බලපවත්නා සේවයට පැමිණීමේ නියමයන්ට යටත්ව මෙම ප්‍රසාද මුදල ගෙවීම ගැන සලකා බැලිය හැකිය.

03. 2005 වර්ෂයේදී විවිධ තත්ත්වයන් යටතේ නිශ්චිත අමාත්‍ය මණ්ඩල අනුමතිය ඇතිව ඉහත (ආ) සහ (ඇ) යටතේ වන විධිවිධානවලින් බැහැරව, තම සේවකයින්ට වාර්ෂික ප්‍රසාද මුදල් ගෙවා ඇති සංවිධානයන් විසින්, එකී බැහැරවීම සඳහා බලය දෙනු ලැබීමට හේතුකාරක වූ තත්ත්වයන් තවමත් පවතින්නේ නම්, පවත්නා වර්ෂය සඳහා ද ඒ ආකාරයෙන්ම ප්‍රසාද මුදල් ගෙවනු ලැබිය හැකිය.

04. ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය සේවකයින්හට ගෙවා ඇති විටෙක එම ගෙවීම අතිරේක ප්‍රසාද මුදලක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමතිය ඇත්නම් මිස එය ද වර්ෂය අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකියයුතුය.

05. යථෝක්ත නිර්නායකයන්ගෙන් බැහැරවීම අවශ්‍යවන්නා වූ කිසියම් අවස්ථාවක් ඇති වුවහොත්, එය, ඒ පිළිබඳ අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය ද සමග කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය. එවිට, කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් ද විමසමින් ඊට අදාල අයෝජන මත ලැබෙන ප්‍රතිලාභය සහ එම ගෙවීම් තුලින් ඇති වන මූල්‍ය බැඳීම හේතුකොට ගෙන අදාල ආයතනයෙහි ස්වයං ආර්ථික ශක්තිය කෙරෙහි ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් එම ඉල්ලීම අගැයීමට ලක්කර, ඒ පිළිබඳ සිය නිරීක්ෂණ, තීරණයක් ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කැරෙනු ඇත.

06. ඒ ඒ ආයතනයන් භාර රේඛීය අමාත්‍යාංශ සහ එම ආයතනයන්හි කළමනාකරණ මණ්ඩල, සැක සහිත කරුණු භාණ්ඩාගාරය විමසා පැහැදිලි කරවාගෙන, ඉහත සඳහන් මාර්ගෝපදේශයන්ට අනුකූලව මෙකී ප්‍රසාද මුදල් ගෙවන බවට සහතික විය යුතුය. පැහැදිලි කිරීමක් සඳහා හෝ අලුතෙන් අනුමැතියක් ලබාගැනීම සඳහා හෝ කැරෙන සෑම ඉල්ලීමක් ම, අදාල රේඛීය අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කළ යුතු අතර රේඛීය අමාත්‍යාංශය එකී ප්‍රශ්නගත කරුණු, ඒ පිළිබඳව තම අදහස් සහ නිර්දේශයන් ද සමග භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය.

07. ප්‍රසාද මුදල් ගෙවීම සඳහා අරමුදල් කිසිවක් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

08. ප්‍රසාද මුදල් ගෙවීම සිදුකළ යුත්තේ ප්‍රශස්ථ රාජ්‍ය පාලන පරිචයන් අනුගමනයකිරීම, අයවැය සහ කෙටුම්පත් ගිණුම් විගණනය සඳහා ඉදිරිපත්කිරීම සහ වාර්ෂික වාර්තා හා පරීක්ෂිත ගිණුම් නියමිත වේලාවට පාර්ලිමේන්තුවේ සභාගතකිරීම යන කරුණුවලට යටත්වය.

09. මෙම චක්‍රලේඛයෙහි අඩංගු කරුණු අවශ්‍ය කටයුතු සඳහා ඔබ අමාත්‍යාංශයේ අධීක්ෂණාත්ෂිය යටතට වැටෙන සියළුම සංස්ථාවල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්ට දැනගැනීමට සැලැස්වුව මැනවි.

(පී බී ජයසුන්දර)
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්.

පිටපත්:-
1. රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්
2. විගණකාධිපති
3. අදාල ආයතන ප්‍රධානීන්

dms c[illegible] bonus